සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

10 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය - 2024 | 15 S I,II

# ක්‍රිස්තියානි ධර්මය

නම: ..........................................

## I පත්‍රය

කාලය පැය තුනයි

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. "බලන්න, කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහි කරන්නීය." මෙම දිවැස් වැකිය ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,
   1. යෙසායා ය. 2. මලාකී ය 3. මීකා ය 4. එසකියෙල් ය.

02. "ලෝකයේ පව් දුරුකරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ" ලෙස ස්නාවක ජොහාන්තුමා විසින් හඳුන්වනු ලැබුයේ,
   1. සෙකරියස් පූජකතුමා ය. 2. ජේසුස් වහන්සේ ය.
   3. ස්තේපන් තුමාය. 4. ගාබ්‍රියෙල් දේවදූතයා ය.

03. කිතු උපත පිළිබඳ ආරංචිය පළමුවරට දැන්වූයේ,
   1. රජවරුන්ට ය. 2. දිවැසිවරුන්ට ය. 3. ගෝලයින්ට ය. 4. එඬේරුන්ට ය.

04. දෙවියන් වහන්සේට සන්තකවීමේ තත්ත්වයට ඇතුළුවීමේ ජුදා චාරිත්‍රය වූයේ,
   1. කැප කිරීමය. 2. බෞතීස්ම කිරීමය.
   3. චර්මඡේදනය ය. 4. දේව මාළිගාවට යාමය.

05. මරණයට පෙර මෙසියස් වහන්සේ දකිනා බව අනාවරණය කරනු ලැබුයේ,
   1. සීමොන් ය. 2. පේදුරු ය. 3. සිමියොන් ය. 4. මතෙව් ය.

06. "මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙකි" ජේසුස් වහන්සේ මොහු යනුවෙන් හැඳින්වූයේ,
   1. සාකෙවුස් ය. 2. කොරනේලියස් ය. 3. පේදුරු ය. 4. ජුදස් ය.

07. දේව පණිවිඩයට කීකරු වූ මරියතුමියගේ ජීවිතයෙන් අපට ගතහැකි ආදර්ශය වනුයේ,
   1. යටහත්පහත්කම ය. 2. නිහතමානීකම ය.
   3. විශ්වාසවන්තකමය. 4. එඩිතරකමය.

08. මාර්තාගේ චරිතයෙන් ඔබට ආදර්ශයට ගතහැකි ගුණාංගය වන්නේ,
   1. දේව වචනයට සවන් දීමයි. 2. ආගමික පෝෂණයයි.
   3. කිතුණු අනුගාමිකත්වයයි. 4. ආගන්තුක සත්කාරයයි.

09. "ස්වාමීනි, මා ඔබගේ උපකරණයෙක් කරගත මැනව..." යනුවෙන් යාච්ඤා කරනු ලැබුයේ,
   1. අසීසියේ ෆ්‍රැන්සිස්තුමාය. 2. පාවුල්තුමා ය. 3. ජාකොබ්තුමාය 4. ජේසුස් වහන්සේ ය.

10. ධර්මදූත චාරිකාවලට සහභාගී වී පැමිණි ශ්‍රාවකයින්ට සතුටුවන්න යැයි ජේසුස් වහන්සේ පැවසූයේ,
   1. යක්ෂයින් දුරුකළ නිසා ය. 2. ස්වර්ගයේ නම ලියැවී ඇති නිසා ය.
   3. රෝගීන් සුව වූ නිසා ය. 4. මිනිසුන් ශුභාරංචිය පිළිගත් නිසා ය.

11. නව ජීවිත මඟකට යොමු වී දේව කැමැත්ත මත තම ජීවිතය රඳවාගැනීම හඳුන්වන්නේ,
   1. ආලෝකය ලැබීම යනුවෙනි 2. දේව බලය යනුවෙනි
   3. ශුද්ධාත්මයෙන් පූර්ණ වීම යනුවෙනි 4. මනස්ථාපනය යනුවෙනි.

12. ජේසුස් වහන්සේ තම සේවය ආරම්භ කරනු ලැබුයේ,
   1. බෙත්ලෙහෙමේ සිනගෝගයෙන් ය. 2. නාසරෙත්හි සිනගෝගයෙන් ය.
   3. ජෙරුසෙලම් දේවමාළිගාවෙන් ය. 4. ජුදයේ සිනගෝගයෙන් ය.

13. “ප්‍රේරිත” යන්නෙහි අර්ථය වන්නේ,
1. විශේෂ මෙහෙයක් සඳහා පුහුණු කරවනු ලැබූ යන්න ය. 2. ධර්මදූත සේවය ඉටුකිරීම යන්න ය.
3. විවිධ වෘත්තීන්වල නියැලීම යන්නය. 4. තරාතිරම් නොබලා සේවයට යොමු කිරීම යන්නය.

14. දේව කැඳවීමට මරියතුමියගේ ප්‍රතිචාරය මඟින් කිතුණු දරුවන් වන අප හට දෙන ආදර්ශය වන්නේ,
1. අපට ද දේව කැඳවීම ලැබෙන බව ය. 2. අප දේව කැඳවීමට අවනත විය යුතු බව ය.
3. නිහතමානීව දේව කැඳවීම පිළිගත යුතු ය. 4. ඉහත සියල්ලම

15. ජෝසප් සහ මරියා සංගණනයට ලියාපදිංචිය සඳහා යනු ලැබුයේ,
1. ගලීලයේ නාසරෙත් නුවරටය. 2. ජුදයේ බෙත්ලෙහෙමටය
3. ජුදයේ ජෙරුසෙලමටය 4. ගලීලයේ කානා නුවරටය.

16. ස්නාවක ජොහාන්තුමා බෞතීස්ම ස්නාපනය යොදාගනු ලැබුයේ,
1. ශුද්ධාත්මදානයේ සංකේතයක් ලෙසය. 2. සදාතන ජීවනය ලබාගැනීමටය.
3. ශරීරය පිරිසිදු කරගැනීමටය. 4. මනස්ථාපනයේ සංකේතයක් ලෙසටය.

17. “මට වඩා ආනුභාව සම්පන්න උතුමෙක් එන්නේය” එතුමන්ගේ පාවහන්වල පටි මුදන්නටවත් මම නොවටිමි” ස්නාවක ජොහාන්තුමා මෙම ප්‍රකාශයෙන් අවධාරණය කරනු ලබනුයේ,
1. එතුමාගේ විශ්වාසනවන්ත බවයි. 2. එතුමාගේ දුර්වල බවයි.
3. එතුමාගේ යටහත් පහත් බවයි. 4. එතුමාගේ කීකරුකමයි.

18. පැමිණෙන්නට සිටින තැනැන්වහන්සේගේ ශ්‍රේෂ්ඨබව පිළිබඳ පැහැදිලි කළ දිවැසිවරයා වූයේ,
1. මලාකි දිවැසිවරයා ය. 2. මීකා දිවැසිවරයා ය.
3. යෙසායා දිවැසිවරයා ය. 4. එලීෂා දිවැසිවරයා ය.

19. ජුදා චාරිත්‍රයක් වන කැපකිරීමේ අවස්ථාවේ දී ජේසුස් වහන්සේගේ දෙමව්පියන් පූජා කරනු ලැබුයේ,
1. බැටළුවෙකු ය. 2. කොබෙයියන් දෙදෙනෙකු ය.
3. රත්තරන් හා සුවඳ ලාටුය. 4. ප්‍රථම ඵල අස්වැන්න ය.

20. කිතුණු දරුවකු වන ඔබ තම ජීවිතය හැඩගසාගත යුත්තේ,
1. තම හැකියාවන් වර්ධනය කරගැනීමෙන් ය. 2. කිතුණු ආකල්ප අනුව සාක්ෂි දැරීමෙන් ය.
3. කිතුණුකම අන්‍යයන්ට කියාපෑමෙන් ය. 4. අන් අයගේ ක්‍රියාවන් විවේචනය කිරීමෙන් ය.

21. ජේසුස් වහන්සේගේ සේවයේ ඉලක්කය වඩාත් පැහැදිලි වූයේ,
1. ස්නාවක ජොහාන්ගේ සාක්ෂියෙන් ය. 2. නාසරෙත් සිනගෝගයේ දේශනාවෙන් ය.
3. මිටියාවතේ පැවැත් වූ දේශනාවෙන් ය. 4. තමාට එල්ල වූ විවේචන ප්‍රතික්ෂේප කිරීමෙන් ය.

22. “සැඩොක්” නමැත්තකුගෙන් පැවත එන්නන් ලෙස හඳුන්වනු ලබනුයේ,
1. සද්දුසිවරු ය 2. පරිසිවරු ය. 3. විනයධරයන් ය. 4. එපීසවරු ය.

23. සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබුණේ,
1. නාසරෙත්හි ධර්ම ශාලාව ය. 2. ජෙරුසලම් දේව මාළිගාව ය.
3. ජුදා සැන්හෙඩ්‍රින් සභාව ය. 4. ජෙරුසලම් සිනගෝග ය.

24. සද්දුසිවරු පිළිබඳ වැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
1. ඔවුහු භාවිත කළේ ලිඛිත ව්‍යවස්ථාව පමණ ය.
2. දේව දූතයන් හා පුනරුජ්ජීවනය විශ්වාස කළේ නැත.
3. ඔවුහු ස්නාවක ජොහාන්තුමාගේ ඉගැන්වීම් පිළිනොගත්හ.
4. ඔවුහු දන් දීමේ දී හොරණෑ නාදයෙන් එය ප්‍රචලිත කළහ.

25. තම සිත් සෝදිසිකර බැලීමට අභියෝග කරමින් ජේසුස් වහන්සේ සද්දුසිවරුන්ට පවසන ලද උපමාව වන්නේ,
1. පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව ය. 2. අත්තිවාරම් දෙක පිළිබඳ උපමාව ය.
3. මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව ය. 4. අත්තික්කා ගස පිළිබඳ උපමාව ය.

26. එකල ජුදෙව් ජනයාට බදු ගෙවීමට තිබූ කාසි දෙවර්ගය වනුයේ,
1. දිනාර් කාසි හා තඹ කාසිය. 2. දිනාර් කාසි හා රිදී කාසිය.
3. දිනාර් කාසි හා රියාල් කාසිය. 4. දිනාර් කාසි හා යුරෝ කාසිය.

27. සාමාන්‍ය ජුදෙව් පාස්කු මංගල්‍යයක දී එක් අයෙකුට සපයනු ලැබූ මුද්‍රික පාන කුසලාන ගණන කීයද?
1. එකකි. 2. දෙකකි. 3. තුනකි. 4. හතරකි.

28. "මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කළේ,
1. පාළුකරයේ දී ය. 2. ධර්මශාලාවේ දී ය.
3. ඔලීව කන්දේදී ය. 4. කුරුස ගසේදී ය.

29. ජුදෙව් ආගමික නීතිය අනුව චෝදනා විභාග කර තීන්දුව දෙනු ලැබුයේ,
1. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ය. 2. පිලාත් ආණ්ඩුකාරවරයා විසින් ය.
3. හෙරොද් රජතුමා විසින් ය. 4. රෝම ආණ්ඩුකාරවරයා විසින් ය.

30. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය නියෝජනය කළ පරිසිවරු සහ සද්දුසිවරු යන දෙපාර්ශවයෙහිම ගණන වූයේ,
1. පනහකි. 2. හැටකි 3. හැත්තෑවකි 4. අසූවකි.

31. ජුදා ජනතාව ජේසුස් වහන්සේ වෙනුවට නිදහස් කරන ලෙස පිලාත් ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලා සිටියේ,
1. ජයිරස්ව ය. 2. නිකදේමුස්ව ය. 3. ජුදාස්ව ය. 4. බරබ්බස්ව ය.

32. ශුද්ධ ලූක් ශුභාරංචියට අනුව ජේසුස් වහන්සේ විසින් වදාළ අවසන් වදන වනුයේ,
1. "මාගේ කැමැත්ත නොව, ඔබගේ කැමැත්ත වේවා! " 2. "පියාණනී, ඔබගේ හස්තයට මාගේ ආත්මය බාර දෙමි"
3. "සියල්ල නිම විය" 4. "පියාණනී, ඔවුනට කමාවුව මැනව"

33. පුනරුජ්ජීවනය පිළිබඳ විශ්වාසය හාස්‍යයට ලක් කිරීමේ අරමුණින් සද්දුසිවරුන් විසින් නිර්මාණය කර ජේසුස් වහන්සේට ඉදිරිපත් කරන ලද පැනය වූයේ,
1. අධිකාරී බලය පිළිබඳ පැනය ය. 2. සත්දෙනෙකුගේ බිරිඳ වූ ස්ත්‍රිය පිළිබඳ පැනය ය.
3. ස්වර්ග රාජ්‍යයේ උදාව පිළිබඳ පැනය ය. 4. උත්ථානය පිළිබඳ පැනය ය.

34. තමන් වහන්සේගේ හිත් තැවුල මධ්‍යයේ පවා තම ශ්‍රාවකයන් දිරිමත් කිරීමට ජේසුස් වහන්සේ උත්සුක වූ බව පෙන්වන ප්‍රකාශය වන්නේ,
1. "පරීක්ෂාවට නොවැටෙන පිණිස යාච්ඤා කරන්න"
2. එහෙත් ඔබේ ඇදහිල්ල නොබිඳෙන පිණිස යාච්ඤා කරන්න"
3. "ඔබ යළිත් හැරුණු පසු ඔබේ සහෝදරයන් දිරිමත් කරන්න"
4. "පියාණනී, ඔවුනට කමාවුව මැනව. ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති"

35. පේදුරුතුමාගේ මහා ප්‍රකාශය වූයේ,
1. ඔබේ සහෝදරයින් ධෛර්යමත් කරන්න යන්න යි. 2. මනුෂ්‍ය පුත්‍රයාට බලය තිබේ යන්න යි.
3. අවදිව යාච්ඤා කරන්න යන්න යි. 4. ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය යන්නයි.

36. ජේසුස් වහන්සේට කුරුසිය උසුලාගෙන යාමට උදව් කළේ,
1. අරමාතියේ ජෝසප් ය. 2. අරමාතියේ සීමොන් ය.
3. කිරේනියේ සීමොන් ය. 4. කිරේනියේ ජෝසප් ය.

37. ජේසුස් වහන්සේව පාවා දීමෙන් පසුව මුර සෙබළුන් විසින් උන්වහන්සේ පළමුව ගෙනයනු ලැබුයේ,
1. හෙරොද් රජතුමා වෙතය. 2. පිලාත් ආණ්ඩුකාරවරයා වෙතය.
3. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ය. 4. උත්තම පූජක මැදුර වෙතය.

38. ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයෙකුව සිටිමින් වුවද ජේසුස් වහන්සේ කුරුසිපත් කිරීමේ ජුදෙව්වන්ගේ ක්‍රියා කලාපය අනුමත නොකළ පුද්ගලයෙකු වනුයේ,
1. කිරේනියේ ජෝසප් ය. 2. අරමාතියේ ජෝසප් ය.
3. පේදුරුතුමා ය. 4. මුර සෙබළෙකු ය.

39. ජුදයේ රෝම ආණ්ඩුකාරවරයාව සිටියේ,
1. පොන්තියුස් පිලාත් ය. 2. කිරේනියේ සීමොන් ය. 3. පේදුරු තුමාය. 4. හෙරොද් රජතුමා ය.

40. "ඔබ ජුදෙව්වන්ගේ රජු ද? " මෙසේ අසනු ලැබුයේ,
1. පරිසිවරුන් ය. 2. සද්දුසිවරුන් ය. 3. පිලාත් ය. 4. ජුදා ජනතාව ය.

$(1 \times 40 = 40)$

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. කිතුණු සසුන තුළ පවතින පිළිවෙත් දෙකක් ලියන්න.
ii. සෙකරියස් පූජකතුමාගේ ජීවිතයේ දක්නට ලැබුණ ගුණාංග දෙකක් ලියන්න.
iii. ජුදෙව් ජනතාව පීඩනයට පත්වීමට හේතු වූ කරුණු දෙකක් ලියන්න.
iv. ප්‍රතික්ෂේප වූ දිවැසිවරයා පිළිබඳව දැනගැනීමට ජේසුස් වහන්සේ විසින් ප්‍රකාශ කළ ප්‍රස්ථා පිරුළු දෙක ලියා දක්වන්න.
v. ජුදෙව් ජන සමාජය තුළ තෙලින් ආලේප කරනු ලැබූ කණ්ඩායම් දෙකක් ලියන්න.
vi. විනයධරයන් හෙවත් ලියන්නන් විසින් සිදුකරන ලද කාර්යයන් දෙක ලියන්න.
vii. සද්දුසිවරුන්ගෙන් පත් වූ දේව මාලිගාවේ තනතුරු දෙක කුමක් ද?
viii. ජේසුස් වහන්සේගේ කාලයේ සිටි රෝම අධිරාජ්‍යවරයා සහ ආණ්ඩුකාරවරයා ලියා දක්වන්න.
ix. ජේසුස් වහන්සේගේ උත්ථානයට සාක්ෂි දැරුවන් දෙදෙනෙකු නම් කරන්න.
x. වර්තමාන සමාජයේ පාසල් සිසුන් මුහුණ දෙන පරීක්ෂාවන් දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) i. ජේසුස් වහන්සේගේ උපතට අදාළව ශුද්ධ මතෙව්තුමාගේ සුබසුනෙහි දැක්වෙන සංකේත දෙක ලියන්න.
ii. සෙකරියස්තුමාගේ ප්‍රශංසා ගීතයෙන් අවධාරණය කෙරෙන සත්‍යතාවන් තුනක් පෙන්වා දෙන්න.
iii. ජේසුස් වහන්සේගේ ජීවිතයෙන් ඔබට ගතහැකි ආදර්ශ පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(03) i. ගලීල මුහුදට කියන තවත් නම් දෙකක් ලියන්න.
ii. පේදුරුතුමා ජේසුස් වහන්සේගේ කැඳවීමට ප්‍රතිචාර දැක්වීමෙන් ඉස්මතුවන ප්‍රධාන කරුණු තුනක් ලියා දක්වන්න.
iii. ඔබට දේව කැඳවීමක් ලැබුණහොත් ක්‍රියාකරන ආකාරය කරුණු පහකින් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(04) i. ජේසුස් වහන්සේ ඉදිරිපත් කළා වූ පුළුල් පවුල් සංකල්පය ලියා දක්වන්න.
ii. ජේසුස් වහන්සේ කාන්තාවන් පිළිගත් බවට උදාහරණ තුනක් පෙන්වා දෙන්න.
iii. කිතුණු පවුලක් ගොඩනගා ගැනීමට ඔබට දායක විය හැකි ආකාර පහක් විස්තර කරන්න.

(ලකුණු 2 + 3 + 5 = 10)

(05) i. සමකාලීන සමාජයේ ජුදෙව් ප්‍රධානීන් ලෙස වැජඹුණ කණ්ඩායම් දෙක නම් කරන්න.
ii. තමන් වඩාත් ධාර්මික යැයි පෙන්වීමට පරිසිවරු විසින් සිදුකරන ලද ක්‍රියාවන් තුනක් ලියන්න.
iii. ජේසුස් වහන්සේ හා විනයධරයින් අතර පැවති සංවාද තුළින් කිතුණු ඔබගේ ජීවිතවලට එකතු කරගත හැකි ගුණාංග පහක් ලියා දක්වන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(06) i. ජේසුස් වහන්සේ, පාපය මිස පව්කරුවා ප්‍රතික්ෂේප නොකළ බවට උදාහරණ දෙකක් ලියන්න.
ii. රෝම ආණ්ඩුකාරවරයා ඉදිරියේ දී ජේසුස් වහන්සේට විරුද්ධව ඉදිරිපත් කරන ලද රාජ්‍ය විරෝධී චෝදනා තුන ලියා දක්වන්න.
iii. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් පස් දෙනෙකු නම් කර ඔවුන්ගේ ප්‍රතිචාර තුළින් කිතුණු දිවියට ගෙනෙන පණිවිඩ වෙන වෙනම ලියා දක්වන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

(07) තෝරාගත් මාතෘකා දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

1. ජේසුස් වහන්සේ කැපකිරීම
   - කැපකිරීමට අදාළ ඉතිහාස කතාව
   - ජේසුස් වහන්සේව කැපකිරීමට රැගෙන ගිය ස්ථානය
   - කැප කිරීම සඳහා පූජා කරන ලද සතුන්.
   - කැප කිරීමට රැගෙන යාමේ දී දේව මාළිගාවේ දී හමු වූ විශේෂ පුද්ගලයින් දෙදෙනා
   - එම පුද්ගලයින් දෙදෙනා විසින් සිදුකරන ලද විශේෂ ප්‍රකාශයන් (ලකුණු 05)

2. නාසරෙත්හි දහම් දෙසුම
   - ජේසුස් වහන්සේ විසින් කියවන ලද ශුද්ධ බයිබලීය ග්‍රන්ථයේ නම හා පාඨය
   - එම ශුද්ධ ලියවිලි පාඨයේ අඩංගු කරුණු
   - එම කරුණු තුළින් ඉස්මතුවන සේවයේ අරමුණුද
   - එම අවස්ථාවේ දී ධර්මශාලාවෙහි සිටි අයගේ ප්‍රතිචාරය
   - ජේසුස් වහන්සේ එයට පිළිතුරු ලබාදුන් ආකාරය (ලකුණු 05)

3. ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂාවන්
   - පරීක්ෂාවලට මුහුණ දුන් ස්ථානය
   - ජේසුස් වහන්සේ මුහුණ දුන් පරීක්ෂා වර්ග තුන
   - එක් එක් පරීක්ෂාවන් හට උන්වහන්සේ ප්‍රතිචාර දැක් වූ ආකාරය
   - එම ප්‍රතිචාර දැක්වීම සඳහා උපයෝගී කරගත් ශුද්ධ ලියවිලි ග්‍රන්ථය
   - එක් එක් පරීක්ෂා තුළින් අපට ලැබෙන සමස්ථ පණිවිඩය (ලකුණු 05)

4. දේව මාළිගාව පවිත්‍ර කිරීම
   - රාජතේජසින් දේවමාළිගාවට පැමිණි ආකාරය
   - දේව මාළිගාවට ඇතුළුවීමේ දී උන්වහන්සේ දුටු දෙය
   - එහි දී උන්වහන්සේ ක්‍රියාකළ ආකාරය
   - එහිදී සිදුකරන ලද විශේෂ ප්‍රකාශය
   - මෙම සිදුවීම මඟින් කිතුණු අපට ලැබෙන පූර්වාදර්ශය (ලකුණු 05)